# පුරුෂ සමරිසි පුද්ගලයින්ගේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය ගැටලු

එච්.ජේ.එල්.ආර්. හෙට්ටිආරච්චි - ප්‍රජාවිද්‍යා අධ්‍යයනාංශය

පුරුෂ සමරිසි පුද්ගලයන්ගේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය ගැටලු පිළිබඳව විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. ඒ සඳහා ප්‍රතිචාර දක්වන්නන් 100ක නියැඳියක් අරමුණුගත නියැදි ක්‍රමය ඔස්සේ තෝරා ගනිමින්, ප්‍රශ්නවලි මාර්ගයෙන් දත්ත රැස් කර ගන්නා ලදී. නියැඳියේ වයස් ව්‍යාප්තිය 15ත් 44ත් අතර වේ. සමස්තයක් වශයෙන් සලකා බලන විට මෙම නියැඳියට අදාළ ප්‍රතිචාර දක්වන්නන් මුහුණ දෙන සමාජ ආර්ථික ගැටලු අවම මට්ටමක පවතී. යම් ප්‍රතිශතයක් ගැටලුවලට මුහුණ පාන බවට ප්‍රතිචාර දක්වා ඇති නම්, ඒ ඔවුන්ගේ බාහිර ස්වරූපයේ වෙනස්කම්, කතා විලාසය හා ගමන් විලාසය වෙනස් වීම වැනි හේතු සාධක නිසාය. මෙම ප්‍රතිචාරකයන් අතරින් 99% හා 96% ප්‍රතිශතයක් එච්.අයි.වී/ඒඩ්ස් සහ ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදනයන් පිළිබඳව කවර දිනක හෝ අසා ඇත. එම පිරිසෙන් 87% ලිංගාශ්‍රිත ආසාදිත තත්ව සඳහා වන රුධිර පරීක්ෂණයකට හෝ වෛද්‍ය පරීක්ෂණයකට යොමු වී ඇත. ලිංගික සම්බන්ධතාවන් පිළිබඳ විමසීමේ දී නියැදියෙන් 98% කිසියම් දිනක හෝ ලිංගිකව හැසිරී ඇත. බහුතර ප්‍රතිශතයක් (69%) ලිංගිකව හැසිරී ඇත්තේ පුරුෂයකු සමඟ වේ. තම සම්බන්ධතාවල දී එච්.අයි.වී/ඒඩ්ස් හා ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදනවලින් ආරක්ෂා වීම පිළිබඳව 98% අවධානය යොමු කරන අතර, 88% කොන්ඩම් භාවිතය සඳහා යොමු වී තිබේ. පුරුෂ සමරිසිභාවය හා බැඳි ප්‍රධානතම අභියෝගය, එච්.අයි.වී/ඒඩ්ස් අවදානම බව සාහිත්‍ය අධ්‍යයනයේදී හඳුනා ගන්නා ලදී. නමුත් මෙම පර්යේෂණයට අදාළව එකී අවදානම් සහගත තත්වය පිළිබඳව විමසීමේදී වටහා ගත හැකි වන්නේ, මෙම ප්‍රතිචාර දක්වන්නන් වඩා යහපත් සෞඛ්‍ය හා සමාජ යහ පැවැත්මක් උදෙසා කැප වී කටයුතු කරන බවයි. එයට හේතුව වන්නේ ඔවුන් එච්.අයි.වී/ඒඩ්ස් අවදානම අවම කිරීමේ අරමුණින් සමරිසි පුද්ගල කණ්ඩායම් පිහිටුවා දැනුවත් කිරීමේ වැඩසටහන්, උපදේශන සේවා හා වෛද්‍ය පරීක්ෂණ වෙත යොමු කිරීම වැනි විශාල කාර්යයක් සිදු කරන රාජ්‍ය නොවන සංවිධානයක් හා සම්බන්ධව කටයුතු කරනු ලැබීමයි. විශ්ලේෂණයෙන් එළඹගත් නිගමනවලට අනුව සමරිසි ප්‍රජාවේ දැනුවත්භාවය ඇති කිරීම සඳහා සමාජ මාධ්‍යයෙන් කෙටි වීඩියෝ පට බෙදා හැරීම, වැඩමුළු හා සායන පැවැත්වීම සඳහා වෛද්‍යවරුන්ගේ සහය සම්බන්ධීකරණය කිරීම, සමරිසි ප්‍රජාව තුළ මිතුරු කණ්ඩායම් පවත්වා ගැනීමට අවකාශ සැලසීම හා සැබෑ ලෙසම මෙවැනි සබඳතාවන්ගේ බලපෑම විමර්ශනය කිරීමට පර්යේෂකයන්ගේ අවධානය යොමු කිරීම වැනි යෝජනා ඉදිරිපත් කළ හැකිය.

***ප්‍රමුඛ පද:*** *පුරුෂ සමලිංගික, ලිංගික සෞඛ්‍යය*